# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,925 — 1970 සැප්තැම්බර් 25 වැනි සිකුරාදා — 1970.9.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන — — — | 715 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... .. | 711 | මිළ පාලන දැන්වීම් ... — ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය .. | 713 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... — — | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය .. | 713 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා — — | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... — ... | 715 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ — — | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් — — . | 719 |
| | | ''සුරාබදු ආඥපනත'' පිළිබඳ දැන්වීම් — . | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 711

අංකය : ඩී.21/ආර්ජීසී/470.

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා විශ්‍රාම ගැනීමක්

උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා 1968 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට කර්නල් වශයෙන් :—

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) කන්දසියා රාජයෝගම්, ඩී. ඉ.

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 1970 නොවැම්බර් මස 28 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

කර්නල් කන්දසියා රාජයෝගම්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 12 වැනි දින,
කොළඹ දී ය.

9-996

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 අංක 312

අංකය : සී.21/ආර්ටිසිටි/448.

## යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා විශ්‍රාම ගැනීමක්

උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා, 1970 ජූලි මස 2 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) ජෝසප් රේජි එම්මානුවෙල් පරම්සෝති, ල. පා. හ.

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා, 1970 අගෝස්තු මස 25 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම යයන ඇත.

මේජර් ජෝසප් රේජි එම්මානුවෙල් පරම්සෝති, ල. පා. හ.

1970 ජූලි 10 දිනැති අංක 14,914 දරන ගැසට් පත්‍රයේ මෙම නිලධාරියාගේ විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් පළවූ 1970 අංක 207 දරන නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 14 වැනි දින,
කොළඹ දී ය.

9-997

---

1970 අංක 313

අංකය : ඩී/වීඑජ්/17/ඒ (VI)

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1970 අප්‍රේල් මස 1 දින සිට බ්‍රෙවට් ලුතිනන්-කර්නල් වශයෙන් :—

මේජර් රණසිංහ බණ්ඩා වණිගසේකර නාරන්පනාව, ඊඩී, ලශිබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 12 වන දින,
කොළඹ දී ය.

9-943

---

1970 අංක 314

අංකය : ඩී/වීඑජ්/9/ඒ.

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උපසේවයට මාරුකිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 ජූනි මස 1 වැනි දින සිට ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරුකර ඇත :—

මේජර් ප්‍රාන්ක් නානායක්කාර, ල. යු. සේ. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 10 දින,
කොළඹ දී ය.

9-899

---

1970 අංක 315

අංකය : ඩී/වීඑජ්/2/ඒ (III)

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උපසේවයට මාරුකිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 අගෝස්තු මස 10 වැනි දින සිට ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරුකර ඇත :—

කපිතාන් රවීන්ද්‍ර විශාල් ජයවර්ධන, ල. පා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 10 දින,
කොළඹ දී ය.

9-898

---

1970 අංක 316

අංකය : ඩී/වීඑජ්/33/ඒ (II)

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1970 මාර්තු මස 16 වැනි දින සිට ලුතිනන් වශයෙන් :—

දෙවන ලුතිනන් මොහමඩ් එස්මායිල් මීරාසාහිබ් ෆාරුක්, ශ්‍රී.ශේ.බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 12 වන දින,
කොළඹ දී ය.

9-946

---

1970 අංක 317

අංකය : ඩී/වීඑජ්/51/ඒ.

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1970 මාර්තු මස 16 වැනි දින සිට ලුතිනන්වරුන් වශයෙන් :—

දෙවන ලුතිනන් තුසිත ප්‍රසන්න තෙජස්වින් ධම්පාල, ශ්‍රී.ශේ.බ.

දෙවන ලුතිනන් අමර විජේවීර ගුණරත්න, ශ්‍රී.ශේ.බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 12 වන දින,
කොළඹ දී ය.

9-941

---

1970 අංක 318

අංකය : ඩී/වීඑජ්/10/ඒ (II)

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක් හා ඇතුලත් කිරීමක්

1970 සැප්තැම්බර් මස 1 වන දින සිට පහත නම සඳහන් බලලත් නිලධාරියා, යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බල සේනාවේ ලුතිනන් (උපකරණ පාලක) වශයෙන් අධිකාරියට පත්කිරීම සහ ඔහුව ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය (ස්වේච්ඡා) ඒකකයට ඇතුලත් කිරීම උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කරණ ලදී.

1040 බලලත් නිලධාරි II ජෝසප් සෙල්වේරියස් ගොඩමුනේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 12 වන දින,
කොළඹ දී ය.

9-942

1970 අංක 319

අංකය : ඊ.22/ආර්ඊසීවී/184.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරියා 1971 ජනවාරි මස 1 වැනි දින සිට රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායෙන් විශ්‍රාම ගනී.

ලුතිනන් කොමාන්ඩර් ඒ. වී. හෙන්ඩ්‍රිකස්, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් 13 වැනි දින,
කොළඹ දී ය.

9-998

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 320

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත :—

ඒබී. 61/69.

එම්. එස්. මවුජූඩ් මහතා 1970 අගෝස්තු මස 31 වැනි දින දක්වා ද, එස්. ධර්මලිංගම්, බී. ඊ. ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. ඩී. නන්දසේන යන මහතුන් 1971 ජූලි මස 31 වැනි දින දක්වා ද කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් මෙන් වැඩ බැලීමට.

ඒ. 66/70.

ප්‍රධාන සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, ටී. පී. කුමාරගේ මහතා 1970 අගෝස්තු මස 10 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු සිය රාජකාරිවලට අමතරව උපත්, විවාහ, උප්පැන්න හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් ලෙස වැඩ බැලීමට.

ඒ. 60/70.

ලංකා විදේශ සේවයේ වී. එල්. බී. මෙන්ඩිස් මහතා 1970 ජූලි මස 24 වනදා සිට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ විදේශ සම්බන්ධතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස වැඩ බැලීමට.

ඒ. 30/70.

දේශීය ආදායම් සහකාර කොමසාරිස් එල්. ඕ. ද සිල්වා මහතා 1970 ජූනි මස 8 වැනි දින සිට මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 22/70.

ලංකා පරිපාලන සේවයේ ජී. බී. ලෝස් මහතා 1970 මැයි මස 19 දින සිට 1970 ජූනි මස 27 දක්වා අමෙරිකා එක්සත් ජනපදයේ ලංකා තානාපති කාර්යාලයේ ආර්ථික කටයුතු නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

එස්. පී. නානායක්කාර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500, කොළඹ 1,
1970 සැප්තැම්බර් මස 17 දින දීය.

9-1027

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 321

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත :—

අංකය : සීජේපී/ඩබ්ලිව්. 17/69.

එම්. පී. විජේසිංහ මහතා 1970 අගෝස්තු මස 1 වන දින සිට තවදුරටත් නියෝග කරන තෙක් තුන් අවුරුදු ආධුනිකත්ව කාලයකට යටත්ව ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් පත් කර ඇත.

අංකය : ජේඑම්/ජී. 41/66.

කේ. ජේ. ජස්ටින් පෙරේරා මහතා 1970 සැප්තැම්බර් මස 12 දින සිට 16 වැනි දින දක්වා ඔහුගේ රාජකාරිවලට අතිරේක වශයෙන් නැවත නියෝගයක් කරන තෙක් මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඇල්/ජී. 12/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ටී. එස්. පී. ද එස්. ගුණසේකර මහතා 1970 සැප්තැම්බර් මස 30 වැනි දින සිට බලපිටියේ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/62.

කේ. වී. ස්වර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ඔ. එම්. තාහිර් මහතා 1970 සැප්තැම්බර් මස 1 දින සිට කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 13/67.

ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එම්. ඕ. එම්. තාහිර් මහතා 1970 සැප්තැම්බර් මස 13 වැනි දින සිට, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 22/59.

ටී. පී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. වී. නඩරාජ මහතා 1970 සැප්තැම්බර් මස 7 වැනි දින සිට 14 වැනි දින දක්වා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 25/61.

ජේ. බී. සී. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. මහේස්වරන් මහතා 1970 සැප්තැම්බර් මස 14 දින සිට නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහේස්ත්‍රාත් තැන, ළමා මහේස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්. ,

අංකය : ජේඑල්/පී. 6/65.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 සැප්තැම්බර් මස 12 දින යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහේස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 15/69.

එල්. එච්. පී. වීරසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ආර්. වික්‍රමසිංහ මහතා 1970 සැප්තැම්බර් මස 27, 28 සහ 30 දිනයන්හි ගාල්ලේ අතිරේක මහේස්ත්‍රාත් තැන අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහේස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 19/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. සුරවීර මහතා 1970 සැප්තැම්බර් මස 9 දින කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 සැප්තැම්බර් මස 9 දින සහ 10 දිනයන්හි හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල් /එච්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ජී. පණ්ඩිතසේකර මහතා 1970 සැප්තැම්බර් මස 11 දින සිට 13 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 22/59.

ටී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු 1970 සැප්තැම්බර් මස 14 දින සිට 18 දින දක්වා එම්. ජේ. පීරිස් මහතා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 13/66.

එස්. ආනන්දකුමාරස්වාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එස්. ඉලයතම්බි මහතා 1970 සැප්තැම්බර් මස 11 දින සිට 13 දින දක්වා යාපනේ අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ මල්ලාකම්හි ළමා මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 17/55.

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සිවගුරුනාදන් මහතා 1970 සැප්තැම්බර් මස 9 දින කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහේස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඇම්. ඇම්. අබුතහීර් මහතා 1970 අගෝස්තු මස 30 වැනි දින සිට සැප්තැම්බර් මස 1 වැනි දින දක්වා මන්නාරමේ අතිරේක මහේස්ත්‍රාත් තැන, ළමා මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 සැප්තැම්බර් මස 21 වැනි සහ 22 වැනි දිනයන්හි වවුනියාවේ අතිරේක මහේස්ත්‍රාත් තැන, ළමා මහේස්ත්‍රාත්, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/පී. 10/63.

පී. ජේ. එස්. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් යක් කරන තුරු ආර්වින් ප්‍රනාන්දු මහතා 1970 සැප්තැම්බර් මස 16, 17, 18 වැනි දිනයන්හි හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ පිටිගල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 10/63.

පී. ජේ. එස්. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සිරිමල් ඒ. ඊ. පින්තු මහතා 1970 සැප්තැම්බර් මස 19 සහ 20 වැනි දිනයන්හි හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරලෙයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩබැලීමට.

අංකය : පීඑල්/ඩබ්. 12/66.

පී. ඕ. ආර්. එජේතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. වීරතුංග මහතා 1970 සැප්තැම්බර් මස 4, 5 සහ 6 වැනි දිනයන්හි මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව, කඩවත් සතර, වැලිගම් කෝරලේ කඳුබොඩ පත්තුව සහ ගඟබඩ පත්තුව ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී.2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඩබ්ලිව්. ඩී. එන්. වෙත්තසිංහ මහතා 1970 සැප්තැම්බර් මස 17 සහ 18 වැනි දිනයන්හි රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරළේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ.5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1970 සැප්තැම්බර් මස 13 වැනි දින මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හාරිස්පත්තු සහ පහත හේවාහැට උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්.4/68.

කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සී. ජබාර් මහතා 1970 සැප්තැම්බර් මස 23, 24, 25, 27 සහ 28 වැනි දිනයන්හි කල්මුණේ දිස්ත්‍රික්කයේ කරවකු නින්තවුර් පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්.7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 සැප්තැම්බර් මස 18, 19, 20 සහ 21 වැනි දිනයන්හි වව්නියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච් 5/56.

සී. බී. හුණුකුඹුර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඉන්ද්‍රාණී එම්. එස්. ගොඩකුඹුර මෙනෙවිය 1970 සැප්තැම්බර් මස 1 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් සහ කොලොන්නා කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී.9/61.

එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු කේ. ඒ. ප්‍රේමතිරත්න මහතා 1970 සැප්තැම්බර් මස 5, 6 සහ 7 වැනි දිනයන්හි මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ උතුර ඒ සහ බී අළුත්කුරු කෝරලේ දකුණ සහ සියනෑකෝරලේ බටහිර (අධිකාරි පත්තුව) ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ/8/57.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1970 සැප්තැම්බර් මස 19 වැනි දින සිට වලල ගම්බද උසාවියේ අංක 6251 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර සහ උඩ දුම්බර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/බී.13/69.

බී. එස්. වික්‍රමසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එන්. එදිරිසිංහ මහතා 1970 සැප්තැම්බර් මස 4 වැනි දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත, දකුණ, උතුර, නැගෙනහිර සහ බස්නාහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ.8/64.

එස්. කඩවතආරච්චි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. ඩබ්ලිව්. ඒ. එමැනුවෙල් මහතා 1970 සැප්තැම්බර් මස 6 වැනි දින සහ 7 වැනි දිනයන් හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්.6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. එච්. එම්. ජෞපර් මහතා 1970 සැප්තැම්බර් මස 11 වැනි දින සහ 12 වැනි දිනයන් හි කල්මුණේ දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/සී.2/62.

සී. ඒ. ක්‍රිස්පින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජී. සූරියආරච්චි මහතා 1970 සැප්තැම්බර් මස 6 වැනි දින සහ 7 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති සහ ගල්ගමුව තිකවැරටිය, කුලියාපිටිය, පන්නල, බිංගිරිය, හිරියාල හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී.7/57.

සුධර්මා ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ආර්. පී. අබේවික්‍රම මහතා 1970 සැප්තැම්බර් මස 5 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ, පහත බුලත්ගම, අටළගම සහ පනාවල් කෝරළේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරළේ සහ කුරුවිටි කෝරළේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී.7/59.

සුධර්මා ධර්මදාස මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු චන්ද්‍රපාල කුමාරගේ මහතා 1970 සැප්තැම්බර් මස 4 සහ 6 වැනි දිනයන් හි අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ, පහත බුලත්ගම, අටළගම සහ පනාවල් කෝරළේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරළේ සහ කුරුවිටි කෝරළේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී.7/57.

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජී. සූරියආරච්චි මහතා 1970 අගෝස්තු මස 30 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව තිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 17 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

9-1023/2

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද අවලංගු කිරීම්

අංකය : පීඑල්/එන්. 2/57.

1970 අගෝස්තු මස 30 වැනි දින සිට සැප්තැම්බර් 1 වැනි දින දක්වා කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්, ඒ. සිමම්පිල්ලේ මහතා වෙත සමාංක හා 1970 අගෝස්තු මස 18 වැනි දින දරණ ලිපියෙන් දී ඇති පත්වීම මෙසින් අවලංගු කරන ලදී.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 සැප්තැම්බර් මස 17 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී.

9-1023/1

---

# වෙනත් පත් කිරීම් ආදිය

1970 අංක 322

## ඉඩම් සංවර්ධන ආඥාපනත (320 වැනි පරිච්ඡේදය)

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6 (1) වැනි ඡේදය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ලං. ප. සේ. III වැනි ශ්‍රේණියේ ආනන්ද මාදෙන මහතා ඔහුගේ රාජකාරිවලට අතිරේකව මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් නිලධාරියෙකු වශයෙන් 1970. 8. 20 වැනි දින සිට පත් කර ඇත.

ආර්. ට්. රත්නතුංග,
අතිරේක ස්ථිර ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

කොළඹ, 10.9.1970.

9-900/2

---

1970 අංක 323

## ඉඩම් සංවර්ධන ආඥාපනත (320 වැනි පරිච්ඡේදය)

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6 (1) වැනි ඡේදය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ගරු ඇමති තුමා විසින් ලං. ප. සේ. IV වැනි ශ්‍රේණියේ කේ. බී. ඒකනායක මහතා ඔහුගේ රාජකාරිවලට අතිරේකව මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් නිලධාරියෙකු වශයෙන් 70.8.20 දින සිට පත් කර ඇත.

ආර්. ට්. රත්නතුංග,
අතිරේක ස්ථිර ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

කොළඹ, 10.9.1970.

9-900/1

---

# ආණ්ඩුවේ නිවේදන

අංකය : ඊබී 25/023.

## ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 10 සහ 13(2) වගන්ති යටතේ ගරු මුදල් ඇමතිතුමා ට පැවරී ඇති බලතල අනුව එතුමා විසින් එච්. ජී. සෝමබන්ධු මහතා 1970 සැප්තැම්බර් 11 දින සිට ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් පත් කොට ඇත.

පී. ඩී. මුණසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 සැප්තැම්බර් මස 17 දින.

9-983

---

## මුද්දර ආඥාපනත

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ෆීලික්ස් සොයිසා,
වැඩ බලන මුදල් ඇමති.

1970 සැප්තැම්බර් 16 වැනි දින,
කොළඹ දීය.

### ව්‍යවස්ථාව

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 1970 අගෝස්තු 28 වැනි දින 14,921 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛණයෙහි 81 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුළත් කිරීමෙන් තව දුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ.

82. ජනතා ජයග්‍රාහී පෙළපාළිය සහිතව දිවංගත ගරු අග්‍රාමාත්‍ය එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පින්තූරය පිළිබිඹු වන ශත 10 වටිනාකමෙන් යුත් තැපැල් සහ ආදායම් මුද්දර.

9-945

## තැපැල් කාර්යාලීය ආඥාපනත

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥා පනතේ 16 වැනි වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970 සැප්තැම්බර් 16 දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථාව

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥා පනතේ 16 වැනි වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 1970 අගෝස්තු 28 වැනි දින 14,921 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛණයෙහි 82 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුලත් කිරීමෙන් තව දුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ.

83. ජනතා ජයග්‍රාහී පෙළපාලිය සහිතව දිවංගත ගරු අග්‍රාමාත්‍ය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පින්තූරය පිළිබිඹු වන ශත 10 වටිනාකමෙන් යුත් තැපැල් සහ ආදායම් මුද්දර.

9-947

---

## 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩල පනත

1961 අංක 67 සහ 1964 අංක 41 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩල (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩල පනතේ 59 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1970 සැප්තැම්බර් මස 1 දින සිට හයමාසයක කාලයක් සඳහා කම්කරු විනිශ්චය සභාවක් ප්‍රතිෂ්ඨාපනය සඳහා ගාල්ලේ, හිරිඹුර, ඊ. ඒ. විජේසූරිය මහතා නැවත පත් කිරීමට, ගරු නැව්කටයුතු හා සංචාරක කටයුතු ඇමතිතුමා සතුටුවී ඇති බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙසින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. කරදවල,
ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 1,
නැව්කටයුතු හා සංචාරක කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

9-836

---

ඇල් ඩී.—බී. 89/48

## තැපැල් හා විදුලි පණිවුඩ ශුභ සාධක සංගම් ආඥාපනත

(286 වැනි අධිකාරය වන) තැපැල් හා විදුලි පණිවුඩ ශුභ සාධක සංගම් ආඥාපනතෙහි 11 වන වගන්තිය යටතේ තැපැල් හා විදුලි පණිවුඩ ශුභ සාධක සංගමය විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් ස්ථිර කරනු ලැබූ රීතියයි.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

1970 සැප්තැම්බර් 12 දින,
කොළඹ දී ය.

රීතිය

1969 දෙසැම්බර් 5 වැනි දින අංක 14 883 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතියෙන් අන්තිම වරට සංශෝධිත, 1949 ජනවාරි 7 වැනි දින අංක 9,936 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද තැපැල් හා විදුලි පණිවුඩ ශුභ සාධක සංගමයේ රීති පහත දැක්වෙන අයුරු තවදුරටත් මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

(1) 1 වැනි පරිච්ඡේදයෙහි 7 (1) වැනි රීතියෙහි—
"විශ්‍රාම වැටුප් හිමි" යන වචන වෙනුවට
"ස්ථිර" යන වචනය ආදේශ කිරීමෙන්

(2) 1 වැනි පරිච්ඡේදයෙහි 9(1) වැනි රීතියෙහි—
"රු. 2, රු. 4, රු. 6," යන යෙදුම වෙනුවට "රු. 4, රු. 6," යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) 1 වැනි පරිච්ඡේදයෙහි 11 (ආ) රීතිය වෙනුවට පහත සඳහන් අලුත් රීතිය ආදේශ කිරීමෙන්—
"(ආ) 'සාමාජිකයකුගේ' මරණය සිදුවුණු අවස්ථාවෙහිදී, නීතිගත සංස්ථාවේ නම් ලැයිස්තුවට අයත් එක් එක් සාමාජිකයකුගෙන් රු. 1 බැගින් ගණන් බලනු ලැබූ පරිත්‍යාගයක් (2) වැනි ඡේදය යටතේ එවැනි මුදලක් සහ පරිත්‍යාගයක් ලැබීමට හිමිකම් ඇති පුද්ගලයාහට හෝ පුද්ගලයන්හට හෝ ඉහත (අ) අනුඡේදය යටතේ නීතිගත සංස්ථාවට අයවිය යුතු සම්භාදා වැඩීමනත් මුදලක් අඩුකර ගැනීමෙන් පසුව, එවැනි පුද්ගලයා හෝ පුද්ගලයන් හෝ විසින් සාමාජිකයාගේ මරණය පිළිබඳව කම්ටුවට ඒත්තු ගැන්වූ දිනයේ සිට මාස තුනක් ඇතුළත ගෙවිය යුතුය."

(4) 1 වැනි පරිච්ඡේදයෙහි 12 (අ) රීතිය වෙනුවට පහත සඳහන් අළුත් රීතිය ආදේශ කිරීමෙන්—
"(1) සාමාජිකයකුගේ මරණය සිදුවන අවස්ථාවේදී නීතිගත සංස්ථාවේ සියලුම සාමාජිකයන්, එම සාමාජිකයා සම්බන්ධයෙන් ගෙවිය යුතු පරිත්‍යාගයන් සඳහා දායක මුදල් ගෙවීමට බැඳී සිටිය යුතුය ;"

(5) 1 වැනි පරිච්ඡේදයෙහි 12 (2) රීතියෙහි—
"පරිත්‍යාගයක් සඳහා දායක මුදල් ගෙවීමට බැඳී සිටින සාමාජිකයින් වෙත කෙරෙන විශේෂ ඉල්ලීමක් මගින්" යන වචන වෙනුවට "සාමාජිකයින්ගෙන් විශේෂ ඉල්ලීමක් මගින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) 1 වැනි පරිච්ඡේදයෙහි 19(2) රීතියෙහි—
"රු. 5,00,000" යන පාඨය වෙනුවට "රු. 6,50,000" යන පාඨය ආදේශ කිරීමෙන් ;

(7) 1 වැනි පරිච්ඡේදයෙහි 19 (3) (අ), (ආ), (ඇ) සහ (ඈ) රීතියෙහි—
"රු. 300" "රු. 500", "රු. 700" සහ "රු. 1,000" යන පාඨ වෙනුවට "රු. 400", "රු.600", "රු. 900" සහ "රු. 1 200" යන පාඨ ආදේශ කිරීමෙන්.

(8) (අ) 1 වැනි පරිච්ඡේදයෙහි 31 වැනි රීතිය, 32 වැනි රීතිය යනුවෙන් නැවත අංක කිරීමෙන් ;
(ආ) 30 වැනි රීතියට ඉක්බිතිවම පහත සඳහන් අළුත් රීතිය ඇතුළත් කිරීමෙන් :—
"31 සංචිත අරමුදල :
සංචිත අරමුදලෙහි බැරව ඇති මුදල් ප්‍රමාණය, එ වැනි ණය මත බේරුම්කොට නොමැති මුදල් ප්‍රමාණයෙන් විස්සෙන් එක් කොටසක් ඉක්මවෙන කාලය දක්වා, ආපදා ණය වෙනුවෙන් ඉපැයුණු පොළී මුදලෙන් සියයට එකක්, අලාභ ආවරණය කිරීම සඳහා සංචිත අරමුදලට පැවරිය යුතුය."

9-1003

---

ආඥා අංකය : 1

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තා වූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70—එච්ඩී/එල්ඒ/8,
වර්ෂ 1970. 8. 19 වන දින,
කොළඹ දී ය.

උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සීමාව තුලවූ වැල්ලවත්ත කොට්ඨාශයේ ගාලු පාරේ වරිපනම් අංක 52 දරණ ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 1.2 පමණ වූ ඉඩම් කොටස් 1 ට මායිම් :

උතුරට : ෆ්‍රාන්සස් පාර ; නැගෙනහිරට : ගාලු පාර ; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස, බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

හිමිකම් කියන අය : ඒ. එච්. ඊ. ද සොයිසා, අංක 41, ජාවත්ත පාර, කොළඹ.

9-1014/1

---

ආඥා අංකය : 2

## වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත

### 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තා වූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70—එච්ඩී/එල්ඒ/8,
වර්ෂ 1970. 8. 19 වන දින,
කොළඹ දී ය.

## උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල්ල ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නාලන්ද නමැති ගමේ පිහිටි තන්දනවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 0, පර්චස් 0, පමණවූ ඉඩම් කෙවස් 1 ට මායිම්;

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස;

නැගෙනහිරට : මාතලේ දඹුල්ල ප්‍රසිද්ධ පාර, අංක 31/8, (බෝක්කුව අසල);

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස;

බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

හිමිකම් කියන අය : වී. සමරසුන්දර, තන්දනවත්ත, නාලන්ද.

9-1014/2

---

## මොනරාගල පාලන දිස්ත්‍රික්කයේ තණමල්විල තානායම වැසීම

මොනරාගල පාලන දිස්ත්‍රික්කයේ තණමල්විල තානායම 1970 ඔක්තෝබර් 1ද සිට වසා තැබීමට තීරණය කර ඇති බැව් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. මහාදේව,
ස්ථිර ලේකම්,
රාජ්‍යපරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

කොළඹ 7,
1970.9.11.

9-839

---

ඇල්. ඩී.—බී 141/47.

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ කම්කරු ඇමතිවරයා විසින් අනුමතය කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණ 1970 ඔක්තෝබර් මස පළමුවැනි දින සිට වලංගු විය යුතුය.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 13 දින,
කොළඹදීය.

## උපලේඛනය

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 9,971 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූද, වරින් වර වෙනස් කරන ලද්දාවූද තීරණ. මීට යාකොට ඇති උපලේඛනයේ පහත සඳහන් පරිදි තවදුරටත් වෙනස් කළ යුතුය.

(I) එම උපලේඛනයේ "III අ" වන කොටස වෙනුවට පහත දැක්වෙන අළුත් "III අ" කොටස යෙදීමෙන් :—

"III අ කොටස

මෙහි පහත දැක්වෙන I වැනි තීරයේ සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම පඩි ප්‍රමාණය විය යුත්තේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනේ දැක්වෙන පඩි ප්‍රමාණවල්ය :—

| I වැනි තීරය<br>කම්කරුවාගේ පන්තිය | II වැනි තීරය<br>පඩි ප්‍රමාණය<br>රු. | <br><br>ශ. |
|---|---|---|
| (අ) අක්කර 75ට නොඅඩු එහෙත් අක්කර 100ට අඩු පොල් වැවිල්ලක හෝ කොටසක නියුක්ත කොන්දෙස්තර කෙනෙකුට මාසයකට ... | 125 | 0 |
| (ආ) අක්කර 100 ට නොඅඩු එහෙත් අක්කර 150 ට අඩු පොල් වැවිල්ලක හෝ කොටසක නියුක්ත කොන්දෙස්තර කෙනෙකුට මාසයකට ... | 150 | 0 |
| (ඉ) අක්කර 150 ට නොඅඩු එහෙත් අක්කර 200 ට අඩු පොල් වැවිල්ලක හෝ කොටසක නියුක්ත කොන්දෙස්තර කෙනෙකුට මාසයකට ... | 175 | 0 |
| (ඊ) අක්කර 200 ට නොඅඩු එහෙත් අක්කර 250 ට අඩු පොල් වැවිල්ලක හෝ කොටසක නියුක්ත කොන්දෙස්තර කෙනෙකුට මාසයකට | 200 | 0 |
| (උ) අක්කර 250 ට නොඅඩු පොල් වැවිල්ලක නියුක්ත කොන්දෙස්තර කෙනෙකුට මාසයකට ... | 225 | 0" |

(2) එම උපලේඛනයේ "V වන කොටස" වෙනුවට පහත දැක්වෙන අළුත් "V වන කොටස" යෙදීමෙන් :—

"V වන කොටස

සෑම සේවා යෝජකයෙක්ම තමා යටතේ වැඩ කරන සෑම සේවකයකුටම සෑම පෝය දිනයක් සුමාන නිවාඩු දිනය වශයෙන් දිය යුතු වන්නේය. පෝය දිනයක් නොයෙදෙන සතියක් වුවහොත් එවැනි සතියක එක් දවසක් සුමාන නිවාඩු දිනය වශයෙන් දිය යුතුය.

එසේ නමුදු සුමාන නිවාඩු දිනයක වුවද පහත දැක්වෙන කොන්දේසි යටතේ ස්වාමියට සේවකයෙකු වැඩෙහි යෙදිය හැකිය :—

(1) එම සුමාන නිවාඩු දිනය සමග ගෙවී යන ඊළග දවස් හය ඇතුලත දවසක් සේවකයාට නිවාඩු දිය යුතුය.

(2) සුමාන නිවාඩු දිනක දී කළ වැඩ සම්බන්ධයෙන්—

(අ) හෝරා 9 (කෑමට හෝරාවකුත් සහිතව) වැඩ කළා වූ හෝ සේවා යෝජකයා වැඩ සපයා දීමට අපොහොසත් වීමේ කාරණාවෙන් හෝරා 9ට අඩු කිසියම් කාල සීමාවක් වැඩ කළා වූ හෝ සේවකයකුට ගෙවිය යුතු පඩිනඩි ප්‍රමාණය වැඩ කරන සාමාන්‍ය දවසක් සඳහා වූ අඩුම ප්‍රමාණය මෙන් එකහමාර ගුණයක් විය යුතුය;

(ආ) වැඩ කිරීමට අකමැත්තක් පහලවීමේ හේතුවෙන් හෝරා 9 කට (කෑමට හෝරාවක් ද ඇතුළුව) අඩුවෙන් වැඩ කළා වූ සේවකයකුට ඔහු වැඩ කළ සෑම හෝරාවක් සඳහාම (වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු අඩුම පඩි ප්‍රමාණය 8 න් බෙදීමෙන් නිශ්චය කර ගත්) හෝරාවක ප්‍රමාණයක මෙන් එකහමාර ගුණයක පඩි ගෙවිය යුතුය;

(ඇ) හෝරා 9 (කෑමට හෝරාවක් ද සහිතව) වඩා වැඩ කළ කම්කරුවෙකුට හෝරා 9 ට වැඩිපුර වැඩ කළ සෑම හෝරාවක් සඳහාම ගෙවිය යුතු පඩිනඩි වන්නේ (වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු අවම පඩි ප්‍රමාණය 8 න් බෙදා නිශ්චය කරගත්) හෝරාවක ප්‍රමාණය මෙන් දෙගුණයකි.

(ඈ) කෑලි ගණනට වැඩ කරන කම්කරුවෙකු සුමාන නිවාඩු දිනයක වැඩ කළ විට ඔහුට ගෙවිය යුතු පඩිය සාමාන්‍ය වැඩ කරන දිනයක එම කෑලි ගණනට ගෙවන අවම ප්‍රමාණය මෙන් එකහමාරක් විය යුතුය.

(3) යම් කාලසීමාවක් තුළ වූ සුමාන නිවාඩු දවසක කළ වැඩ සඳහා සේවකයකුට හිමි පඩිනඩි, පඩිපාලක සභා ආඥාපනතේ 2(බී) වගන්තියෙන් නියමිත කාලය ඇතුලතදීම ගෙවිය යුතුය.

එසේ වුවද, පඩිපාලක සභා ආඥාපනතේ 25 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කර ඇති ආණ්ඩුවේ නිවාඩු දිනයකට සුමාන දිනය යෙදුනහොත්, එකී දිනය ආණ්ඩුවේ නිවාඩු දිනය වශයෙන් දිය යුතුය. එසේම එකී නිවාඩු දිනය සමග ගෙවී යන දින හය ඇතුලත එක් දිනක් සේවකයාට සුමාන නිවාඩු දිනය වශයෙන් දිය යුතුය.

මෙම කොටසේ ඉහත දක්වුනු විධිවිධාන, ගෘහපාලනයේ නිරත සේවකයින්ට අදාළ නොකළ යුතුය."

9-851

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### පාර්ලිමේන්තු මහා මැතිවරණය 1970

### අංක 84—කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් නියෝජිතයකු තෝරා පත් කිරීම

ඉහත කී මැතිවරණයේ මන්ත්‍රීධුරාපේක්ෂකයකු වූ කේ. ජී. ජේරෙමි මහතාගේ මැතිවරණ වියදම් පිළිබඳ වූ වාර්තාව සහ එම වාර්තාවට සම්බන්ධ වූ ප්‍රකාශයත්ද, 1970 ජූනි මස 30 වෙනි දින මා වෙත ලැබුණ බවත්, මෙම දැන්වීම ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දා සිට ඉදිරියට ඇති හය මාසය තුලදී, රුපියල් එකක ගාස්තුවක් ගෙවීමෙන්, එකී වාර්තාව හා ප්‍රකාශයත්ද කාර්යාල වේලාවන් තුල ඕනෑම විටකදී, යාපනය මැතිවරණ කාර්යාලයේදී පරීක්ෂා කළ හැකි බැව්, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 71(1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. නඩරාජා,
සහකාර තේරීම් භාර නිලධාරී තැන,
අංක 84—කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශය.

මැතිවරණ කාර්යාලය,
යාපනය, 1970. 9. 10.

9-949

අංක : සී/අයි 45

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 දරන (සංශෝධිත) පනත් වලින් සංශොධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1964 ජනවාරි මස 10 දින අංක 13,913 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1963 දෙසැම්බර් මස 24 වන දින දරන නියෝගයෙන්

එක් පාර්ශ්වයක් වශයෙන් එස්. ශ්‍රීකාන්ත මහතා, 17, වාල්මන් පාර, කොළඹ 6, ඒ. රාසරත්නම් මහතා, 35, එලිබෑන්ක් පාර, කොළඹ 5 සහ එස්. වික්‍රමරත්න මහතා, 17 වාල්මන් පාර, කොළඹ 6 සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්, හල්ස්ඩෝර්ප් මිල්ස්, කොළඹ 12

අතර ඇති 1963 ඔක්තෝබර් මස 17 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා ඇස්. ඒ. විජයතිලක වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනියන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1963 දෙසැම්බර් මස 24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 12 දින,
කොළඹ දීය.

9-854/1

---

අංක : සී/අයි 45

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ඇස්. ශ්‍රීකාන්ත මහතා, අංක 17, වාල්මන්ට් පාර, වැල්ලවත්ත කොළඹ 6, ඇස්. වික්‍රමරත්න මහතා, මීගල්ල, ඌරාපොල, ඒ. රාසරත්නම් මහතා, අංක 12/2, 27 වන පටුමග, කොල්ලුපිටිය, කොළඹ 3, එක් පාර්ශ්වයක් වශයෙන්

හා

අනෙක් පාර්ශ්වය වශයෙන් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්, හල්ස්ඩෝර්ප් මිල්ස්, කොළඹ 12, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක XV මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 12 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

ඇස්. ශ්‍රී කාන්ත මහතා, අංක 17, වැල්මන්ට් පාර, වැල්ලවත්ත, කොළඹ 6, ඇස්. වික්‍රමරත්න මහතා, මීගල්ල, ඌරාපොල ඒ. රාස රත්නම් මහතා 12/2, 27 වන පටුමග, කොල්ලුපිටිය, කොළඹ 3, එක් පාර්ශ්වයක් වශයෙන්

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්, හර්ස්ඩෝර්ප් මිල්ස්, කොළඹ 12.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, ඇස්. ශ්‍රීකාන්ත, ඇස්. වික්‍රමරත්න සහ ඒ. රාසරත්නම් යන මහත්වරු බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් පිළිබඳව වේ.

1970 සැප්තැම්බර් මස 6 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්,

9-854/2

---

අංකය : සී/අයි 1

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව—

සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළ 10

හා

කොළඹ මහ නගර සභාව, කොළඹ

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 1 වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 සැප්තැම්බර් මස 14 දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත

සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය,

67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10

සහ

කොළඹ මහනගර සභාව, කොළඹ,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

සමස්ත ලංකා පළාත්පාලන කම්කරු සමිතිය හා කොළඹ, කොළඹ මහනගර සභාව අතර පවතින කාර්මික ආරවුල නම්, ඉහත සඳහන් සමිතියේ සාමාජිකයන්වන, බී. දයාරත්න මහතාට (බී. ඊ. 374) හා කේ. ඒ. සුමනපාල මහතාට (බී. ඊ. 387) 69. 4. 19 වන දින කරන ලද වැඩ වෙනුවෙන් දිනක සම්පූර්ණ වේතනය ගෙවීම යුක්ති සහගතද නොඑසේ නම්, ඔවුන් එකිනෙකාට කුමන සහනයන් හිමිද යන්නත් වේ.

1970 සැප්තැම්බර් මස 7 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මෙල්,
කම්කරු කොමසාරිස්,

9-999

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—සහතික මිළ යෝජනා ක්‍රමය

### 1969-70 බඩු ගණන් ගැනීම සඳහා ගබඩා වැසීම

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහතික මිළ යෝජනා ක්‍රමයේ ගබඩා වාර්ෂික බඩු ගණන් ගැනීම සඳහා 1970. 10. 1 සහ 2 යන දිනවල වසනු ලැබේ.

මේ දිනවල ස. මි. යෝ. ක්‍රා. ගබඩාවලට ලැබෙන පරිදි ගොවිද්‍රව්‍ය පිටත් කර නොයවන ලෙසද, ගොවිද්‍රව්‍ය ස. මි. ක්‍රා. ගබඩාවට භාර නොදෙන ලෙසද, සියළුම ගොවිද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමිති වලින් හා විවිධ සේවා සමුපකාර සමිතිවලින් ද ඉල්ලා සිටිනු ලැබේ.

සී. වී. උනම්බුව,
ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1429,
කොළඹ 7. 1970 සැප්තැම්බර්

9-842

---

## 1964 වෙළඳ සමාගම් (ගණන් පරීක්ෂක) රෙගුලාසි 7 (අ) 7 (ආ) වගන්ති යටතේ 1969-1970 කාලපරිච්ඡේදය සඳහා ලියාපදිංචි කරනු ලැබූ ගණන් පරීක්ෂකවරුන්ගේ අතිරේක ලැයිස්තුව

| නම හා ලිපිනය | හවුල්කරුවන්ගේ නම |
|---|---|
| ඇස්. පී මහේන්ද්‍රන් සහ සමාගම, 258/14, ඩැම් ස්ට්‍රීට්, කොළඹ 12. | සුප්පයියා ගෝපාල පිල්ලේ මහේන්ද්‍රන්. |
| අබේසිරිවර්ධන, සෙල්වේන්ද්‍රා සහ සමාගම, 100, කුමාරන් රත්නම් පාර, කොළඹ 2. | දෙමුනි එරික් බග්ලස් ද සොයිසා අබේසිරිවර්ධන හා සබාරත්නම් සෙල්වේන්ද්‍රා. |
| ඇම්. කුමාරස්වාමි සහ සමාගම, 108, පරාක්‍රම පාර, කොළඹ 14. | මයිල්වාගනම් කුමාරස්වාමි. |
| වික්ටර් සහ සමාගම, 89, ප්‍රින්ස් ස්ට්‍රීට්, කොළඹ 11. | වික්ටර් රත්නම් විජයරත්නම්, |
| ඇලන්, මාටින් සහ සමාගම, 70 1/1, චැතැම් වීදිය, කොළඹ 1. | මයිකල් ජෝන් ඇලන් සහ ජෝන් යූස්ටන් බන්ස්ටන් මාටින්. |
| මනෝහරන් සහ සංගක්කාර, 44 2/3, වයි. ඇම්. බී. ඒ. ගොඩනැගිල්ල, කොළඹ 1. | මුතියා මනෝහරන් හා සංගක්කාර මුදියන්සේලාගේ අමර කුමාර සංගක්කාර. |

## 1964 වෙළඳ සමාගම් (ගණන් පරීක්ෂක) රෙගුලාසි 5 (1) (අ) වගන්තිය යටතේ 1969-70 කාලපරිච්ඡේදය තුළ ලියාපදිංචි කරනු ලැබූ ගණන් පරීක්ෂකවරුන්ගේ අතිරේක ලැයිස්තුව

| නම | ව්‍යාපාර ලිපිනය |
|---|---|
| කාලිදාස්, රාමයියා, | 43, ත්‍රිකුණාමල වීදිය, නුවර. |
| මහේන්ද්‍ර, සුප්පයියා ගෝපාල පිල්ලේ, | 258/14, ඩැම් ස්ට්‍රීට්, කොළඹ 12. |
| සෙල්වේන්ද්‍රා, සබාරත්නම්, | 100, කුමාරන් රත්නම් පාර, කොළඹ 2. |
| විජයරත්නම්, වික්ටර් රත්නම්, | 5/1, අරතුසා ලේන්, කොළඹ 6. |

## 1964 වෙළඳ සමාගම් (ගණන් පරීක්ෂක) රෙගුලාසි 5 (1) (ආ) සහ 5 (1) (ඇ) වගන්ති යටතේ 1969-70 කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි කරනු ලැබූ ගණන් පරීක්ෂක වරුන්ගේ අතිරේක ලැයිස්තුව

| නම | ව්‍යාපාර ලිපිනය |
|---|---|
| ඊ. ඩී. විජයරත්න, | 15, පෙපින් ලේන්, කොළඹ 4. |
| ඊ. ඇල්. කේ. අයි. ඒකනායක මහත්මිය, | 265/4, දවටගහවත්ත, මිහිරිගම පාර, මීගමුව. |
| ඇස්. ඇම්. කනගරත්නම්, | 42, අරතුසා ලේන්, කොළඹ 6. |
| ඇස්. ඒ. ස්කානිවෙල්, | 39, පැරලල් පාර, රත්මලාන. |
| පී. කානපතිපිල්ලේ, | 21, 33 වෙනි පටු මාවත, වැල්ල වත්ත. |
| නඩේසපිල්ලේ සහ සමාගම, | 68, සීබ්‍රච් රෝඩ්, කොළඹ 11. |
| වි. කුමාරසිංකම්, | 7, ග්‍රෙගරි පෙදෙස, කොළඹ 6. |

ජේ. එෆ්. පොන්නම්බලම්,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1970 සැප්තැම්බර් 7 වෙනි දින,
කොළඹ දී ය.

9-834

## 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ කොළඹ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය, ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනෙවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

එන්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.8.11.

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය: ගිරාඉඹුල ඇල එල්/12 (11.65×6.95)

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම්: දල වශයෙන් අක්කර 99 යි.
රජයේ ඉඩම්: දල වශයෙන් අක්කර—

3. එකඟවූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්,

එනම් :—1.5′×5′ ඔසවන දොරටු වලින් යුත් සොරොව් තුනක් සහිත සුළු ගංවතුර වැළැක්වීමේ නිර්මිතය.

2. හැරවීමේ ඇල

3. ගිරාඉඹුල ඇල හරහා බැමීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 80,000 දක්වා නැතිම රජය විසින් භාර ගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යෝජිත වැඩය භාර ගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරු වල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම් වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම් සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපති වරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

9-830

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව—රථවාහන ගමනාගමනයට බාධා

### දකුණු කොට්ඨාශය—තංගල්ල දිස්ත්‍රික්කය

### බෙලිගල්ල-විතාරන්දෙනිය-නොටොල්පිටිය පාරේ අංක 1/1 දරණ පාලම නැවත තැනීම

1970. 10. 1 වැනි දින සිට නැවත දන්වන තුරු ඉහත සඳහන් පාලම සියලුම රථවාහන වලට වසාතබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම කාලසීමාව තුළදී අතුරු පාරක් වශයෙන් දම්මුල්ල හන්දිය හරහා බෙලිඅත්ත-වලස්මුල්ල පාර සහ හක්මන-තංගල්ල පාර ඔස්සේ ධාවනය කරවිය හැකිය.

ආර්. ඇලෙක්සැන්ඩර්,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

9-824

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1970 අප්‍රේල් 25 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කර ගන්නා ලදී.

(1) එම්. වී. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1959 සැප්තැම්බර් 15 වෙනි දින සහතික කරන ලද අංක 307 දරණ උගස්කරය මත හුගේගොඩ මිරිහානේ, පොලිස් පාර, අංක 3 දරණ ස්ථානයේ පදිංචි ලීනා මර්සි ජයසිංහ (විවාහයට පෙර-වනිගසේකර) මහත්මියගෙන් 1970. 3. 13 දින දක්වා මුල් මුදල හා පොලිය වශයෙන් රු. 8,231.80 ක මුදලක් හා 1970. 3. 13 දින සිට ගෙවනු ලබන දින තෙක්, රු. 6,707.91 ක මුදල මත අවුරුද්දට සියයට 5½ බැගින් පොලියක් තවදුරටත් ලැබිය යුතුය.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු සහ මුදල් (සංශෝධන පනතින් සංශෝධිත) ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ (398 අධිකාරය) 61ඕ වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ, අළුත්කඩේ වීදියේ, අංක 227 දරණ තැන පී. එච්. විජේසිංහ, වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

බලය ලත් පිස්කාල් මිනින්දෝරු ජේ රුද්රිගු මහතා විසින් 1933 මැයි 3 වෙනි දින සාදන ලද පිඹුර අනුව, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මිරිහානේ, කොට්ටාව පාරේ පිහිටි, පර්චස් විසි අටයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 28.5) ක ප්‍රමාණයෙන් යුත් මාරගහවත්ත නමැති ඉඩමේ "ඕ" අක්ෂරය දරණ, වරිපනම් අංක 3 (කලින් අංක 1) දරණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිල්ල හා වැටිලි සමග.

එම්. වී. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1959 සැප්තැම්බර් 15 වෙනි දින සහතික කරන ලද අංක 307 දරණ උගස්කරය මත ලීනා මර්සි ජයසිංහ (විවාහයට පෙර වනිගසේකර) මහත්මී විසින් මෙම බැංකුවට ඇප වශයෙන් තබා ඇති ඉහතකී ඉඩම, එකී උගස්කරය මත රු. 8,231.80 ක මුදලක් හා 1970. 3. 13 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින තෙක් රු. 6,707.91 ක මුදල මත අවුරුද්දට සියයට 5½ බැගින් පොලියත්, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් හා වියහියදම් ද අය කර ගනු සඳහා.

එච්. බී. කදුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 ජූලි 22 දින,
කොළඹ දී ය.

9-937

---

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1968 මැයි 15 දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණයකර සම්මත කරන ලදී.

(1) එච්. ඊ. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1959 නොවැම්බර් 17 වෙනි දින හා අංක 346 දරණ උකස්කරය මත බම්බලපිටියේ නන්දන උද්‍යානයෙහි අංක 15 දරණ තැන ගොඩවත්තගේ ඕලින් ද සිල්වා මහතාගෙන් 1968.3.18 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රු. 22,731.42 ක මුදල හා 1968. 3. 19 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 20,893.31 ක මුදල මත වර්ෂයකට සියයට 5½ ක පොලියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ (398 අධිකාරය) 62(1) වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ මේ තීරණය රජයේ ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 21 ක් ගතවීමෙන් පසු මින් මතු නියම කරනු ලබන දිනක ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 1, කැනල් රෝ හි අංක 35 දරණ තැන වින්ස්ටන් මෙලිස් ප්‍රනාන්දු වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී ගොඩවත්තගේ ඕලින් ද සිල්වා මහතාගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 22,731.42 ක මුදල සහ 1968. 3. 19 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 20,893.31 ක මුදල මත අවුරුද්දකට සියයට 5½ බැගින් පොලියද, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා නාගරිකය තුළ හැව්ලොක් වටුම කොට්ඨාශයේ බම්බලපිටියේ නන්දන උද්‍යානයෙහි, බලය ලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1959 පෙබරවාරි 20 දින අංක 1484 දරණ පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම හතරයි හතක් (අ, රූ. 0, පර්. 17.47) වූ ඕ 2 වශයෙන් සලකුණු කර ඇති ඉඩම සහ බලය ලත් මිනින්දෝරු බී. ජේ. තිඩිමන් විසින් සාදන ලද 1947 මැයි දාහතම යෙදූ අංක 8610 දරණ පිඹුර අනුව ජේ වශයෙන් සලකුණු කරන ලද පාර සහ ඉහත කී නන්දන උද්‍යානයට අයිති වරිපනම් අංක 15 දරණ ගොඩනැගිල්ල.

එච්. බී. කදුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970. 6. 21 දී,
කොළඹ.

9-938

---

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1967 ඔක්තෝබර් 1 වෙනි දින පවත්වන ලද රැස්වීමේ දි පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී.

(1) එෆ්. ඩී. එල්. කෙ.ක් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1962 අප්‍රේල් 26 වෙනි දින හා අංක 847 දරණ උකස්කරය මත මොරටුව, කොරළවැල්ලේ අංක 31 දරණ ස්ථානයේ පදිංචි බැද්දෙලියනගේ දොන් සුසන්ත සිරිරත්න මහතාගෙන් 1967. 7. 18 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රු. 9,013.98 ක මුදලක් හා 1967. 7. 19 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 7,718.49 ක මුදල මත අවුරුද්දට සියයට 7½ පොලියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ (398 අධිකාරය) 62(1) වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපළ මේ තීරණය ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 21 ක් ගත වීමෙන් පසු මින් මතු නියම කරනු ලබන දිනක ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට පානදුර, ඛයස් ගොඩනැගිල්ලේ එම්. මිල්ටන් පෙරේරා වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී බැද්දෙලියනගේ දොන් සුසන්ත සිරිරත්න මහතාගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 9,013.98 ක මුදල සහ 1967. 7. 19 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 7,718.49 ක මුදල මත අවුරුද්දකට සියයට 7½ බැගින් පොලියද, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමා තුළ එගොඩ උයන, එගොඩඋයන පාරේ වරිපනම් අංක 276/1ඒ (කොටසක්) දරණ සහ බලය ලත් මිනින්දෝරු ඊ. එස්. වීරසූරිය විසින් සාදන ලද අංක 197 හා 1959 මාර්තු 21 දිනැති පිඹුර අනුව ලංසියාවත්ත නමැති ඉඩමේ ලොට් අංක 1 වශයෙන් සලකුණු කර ඇති සහ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම දෙකයි පහක් වූ ඉඩම හා එහි පිහිටි ගෘහකොළ වැටිලි සියළු දේ.
2. ඉහත කී එගොඩ උයන පිහිටි එගොඩ උයන පාරට අයිති වරිපනම් අංක 276/1ඒ (කොටසක්) සහ ඉහත කී අංක 197 දරණ පිඹුර අනුව ලංසියාවත්ත නමැති ඉඩමේ ලොට් අංක 2 දරණ ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විසිඅටක් වූ (අ. 1, රූ. 0, පර්. 28) ඉඩම හා පිහිටි ගෘහකොළ වැටිලි සියළු දේ.
3. ඉහත කී එගොඩ උයන පිහිටි එගොඩ උයන පාරට අයිති වරිපනම් අංක 289 සහ ඉහත කී අංක 197 දරණ පිඹුර අනුව ලංසියාවත්ත නමැති ඉඩමේ ලොට් අංක 8 දරණ ප්‍රමාණයෙන් පර්චස් තිස්නවයයි දශම දෙකයි පහක් වූ (අ. 0, රූ. 0, පර්. 39.25) ඉඩම හා එහි පිහිටි ගෘහකොළ වැටිලි සියළු දේත් සමග ඉහත කී අංක 197 පිඹුර අනුව ලොට් 5 සහ 6 වශයෙන් සලකුණු කර ඇති පාර.

1970. 4. 26 දින,
කොළඹ දී ය.

එච්. බී. කදුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

9-936

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි | ... 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | ... 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7.17 සිකුරාද | ... 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | ... 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | ... 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... 70. 8. 7 සිකුරාද | ... 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | ... 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | ... 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | ... 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | ... 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | ... 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | ... 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | ... 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... 70.10. 2 සිකුරාද | .. 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | ... 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | ... 70.10 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | ... 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | ... 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | ... 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | ... 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | ... 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... 70.12. 4 සිකුරාද | ... 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | ... 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | ... 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | ... 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | ... 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.20 |

එල්. ඩබ්ලිව්. ඕ. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.